# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022.12.21 |

## ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2022 නොවැම්බර් මාසයේ දී අඛණ්ඩව දෙවන වරටත් පහළ ගියේය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 70.6හි සිට 2022 නොවැම්බර් මාසයේ දී සියයට 65.0 දක්වා පහළ ගියේය. එසේම, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 80.9හි සිට 2022 නොවැම්බර් මාසයේ දී සියයට 69.8 දක්වා පහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 61.3හි සිට 2022 නොවැම්බර් මාසයේ දී සියයට 60.4 දක්වා පහළ ගියේය.

| උද්ධමනය | 2022 ඔක්තෝබර් | 2022 නොවැම්බර් |
|---|---|---|
| **මතුපිට** | | |
| දර්ශක අගය | 256.9 | 256.3 |
| මාසික වෙනස (%) | 0.3 | -0.2 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 70.6 | 65.0 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 42.2 | 46.7 |
| **මූලික** | | |
| දර්ශක අගය | 244.6 | 244.9 |
| මාසික වෙනස (%) | 1.3 | 0.1 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 62.4 | 60.1 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 35.7 | 40.0 |

2022 ඔක්තෝබර් මාසයේ දී නිරීක්ෂණය වූ ජා.පා.මි. දර්ශකයේ මාසික වෙනසෙහි පහළ යෑම, 2022 නොවැම්බර් මාසයේ දී ද දක්නට ලැබුණු අතර, එය සියයට 0.27ක් ලෙස වාර්තා විය. මෙයට ප්‍රධාන වශයෙන් දායක වූයේ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මාසිකව සියයට 0.49කින් පහළ යෑමයි. ඒ අනුව, ආහාර කාණ්ඩය තුළ, නැවුම් මත්ස්‍ය, සීනි, සහල්, කරවල, සහ කුකුල් මස් මිල ගණන්හි සැලකිය යුතු පහළ යෑම් දක්නට ලැබුණි. එසේ වුවද, 2022 නොවැම්බර් මාසයේ දී මාසික වෙනස සඳහා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය සියයට 0.23ක් වූ අතර, මේ සඳහා රෙදිපිළි හා පාවහන්, සෞඛ්‍ය (පෞද්ගලික රෝහල්/සාත්තු නිවාස ගාස්තු), ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තුව සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, 2022 නොවැම්බර් මාසය තුළ දී ප්‍රවාහන (පෙට්‍රල්) සහ නිවාස, විදුලිය, ජලය, ගෑස් හා වෙනත් ඉන්ධන (නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය) උප කාණ්ඩවල මිල ගණන් පහළ ගියේය.

**ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (ප්‍රතිශත වෙනස)**




**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




මේ අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2022 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 42.2හි සිට 2022 නොවැම්බර් මාසයේ දී සියයට 46.7 දක්වා ඉහළ ගියේය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2022 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 62.4හි සිට 2022 නොවැම්බර් මාසයේ දී සියයට 60.1 දක්වා පහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2022 ඔක්තෝබර් මාසයේ පැවති සියයට 35.7හි සිට 2022 නොවැම්බර් මාසයේ දී සියයට 40.0 දක්වා ඉහළ ගියේය.

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් ශ්‍රී ලංකාවේ සියලුම පළාත්වල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) |
| 2021 | නොවැම්බර් | 155.3 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 8.8 | 6.2 | 5.0 |
| | දෙසැම්බර් | 161.0 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 10.8 | 7.0 | 5.5 |
| 2022 | ජනවාරි | 166.0 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 12.9 | 8.1 | 6.2 |
| | පෙබරවාරි | 167.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 14.1 | 9.3 | 7.1 |
| | මාර්තු | 172.7 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 17.3 | 10.6 | 8.2 |
| | අප්‍රේල් | 190.3 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 27.9 | 13.0 | 10.2 |
| | මැයි | 208.7 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 37.7 | 16.3 | 13.0 |
| | ජූනි | 231.5 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 49.3 | 20.8 | 16.8 |
| | ජූලි | 244.4 | 229.0 | 5.6 | 6.1 | 66.7 | 57.3 | 25.9 | 21.3 |
| | අගෝස්තු | 250.4 | 235.1 | 2.5 | 2.7 | 70.2 | 60.5 | 31.3 | 26.0 |
| | සැප්තැම්බර් | 256.2 | 241.5 | 2.3 | 2.7 | 73.7 | 64.1 | 36.9 | 31.0 |
| | ඔක්තෝබර් | 256.9 | 244.6 | 0.3 | 1.3 | 70.6 | 62.4 | 42.2 | 35.7 |
| | නොවැම්බර් | 256.3 | 244.9 | -0.2 | 0.1 | 65.0 | 60.1 | 46.7 | 40.0 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව